

# ශ්‍රී ලාංකික ජනතාවගේ සහ දේශයේ සෞභාග්‍ය වෙනුවෙන් කැප වී සිටින අප සමඟ හවුල්කරුවකු වන්නට ඔබත් කැමතිද?

දිවයින පුරා ශාඛා 272 කින් යුත් ජාලයකින් සහ 3000 කට වැඩි ශ්‍රම බලකායකින් යුත් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය සංවර්ධන බැංකුව වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පුරප්පාඩුව ඇති පහත තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත විශිෂ්ට නායකත්ව හැකියාවකින් යුත් පළපුරුදු වෘත්තිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ප්‍රධාන කළමනාකරු - තොරතුරු පද්ධති විගණන

### මූලික සුදුසුකම්

- පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් තොරතුරු තාක්ෂණ හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් සමඟ තොරතුරු පද්ධති විගණනය (IS Auditing) පිළිබඳ අවම වසර 03 ක සුපරීක්ෂණ මට්ටමේ පළපුරුද්දක් ඇතුළුව වසර 07 ක අවම පළපුරුද්දක් ලබා තිබීම. (බැංකු ක්ෂේත්‍රයේ වඩාත් සුදුසු වේ)

  හෝ

  පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් තොරතුරු තාක්ෂණ හෝ අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් /පශ්චාත් උපාධි සුදුසුකමක් සමඟ තොරතුරු පද්ධති විගණනය (IS Auditing) පිළිබඳ අවම වසර 02 ක සුපරීක්ෂණ මට්ටමේ පළපුරුද්දක් ඇතුළුව වසර 05 ක අවම පළපුරුද්දක් ලබා තිබීම. (බැංකු ක්ෂේත්‍රයේ වඩාත් සුදුසු වේ)
- CISA හෝ CISM වෘත්තීය සහතිකය ලබා තිබීම අත්‍යවශ්‍ය වන අතර, CCNA සුදුසුකම විකල්ප වශයෙන් තිබිය හැක.
- Scripting Language පිළිබඳ අත්දැකීම් තිබීම වාසි සහගත වේ.
- ලිඛිත සහ වාචික සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණ කුසලතා සහිත වීම. ඉදිරිපත් කිරීමේ හැකියාව සහිත වීම.
- තොරතුරු තාක්ෂණ මෙහෙයුම් ක්‍රියාවලි/ තොරතුරු පද්ධති සහ තොරතුරු ආරක්ෂණ පාලනය පිළිබඳ මනා දැනුම.
- මනා කළමනාකරණ කුසලතාව සහ සහයෝගයෙන් වැඩ කිරීමේ හැකියාව
- වයස අවු. 50ට අඩු වීම සුදුසුය.

### වැටුප් පරිමාව

තෝරාගනු ලබන අයදුම්කරු බැංකු ක්ෂේත්‍රයේ පවත්නා සම්මත, ආකර්ෂණීය දීමනාවන් සහිත වැටුපකට හිමිකම් කියනු ලබයි.

### අයදුම් කළයුතු ආකාරය

තමා පිළිබඳව විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ තොරතුරු සහිතව තම ජීව දත්ත තොරතුරු ඇතුලත් සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2024 දෙසැම්බර් 24** දින හෝ ඊට පෙර **careers@rdb.lk** ඊමේල් ලිපිනයට යොමු කරන්න. එහි විෂය (Subject) තීරයේ අයදුම්කරනු ලබන අදාළ තනතුර සඳහන් කරන්න.

ඉහත සඳහන් කරන ලද සුදුසුකම් සපුරාලීමට අසමත්වන හෝ වැරදි තොරතුරු ඇතුලත් අයදුම්පත් මෙම බඳවාගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවකදී කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ සහ මෙම බඳවාගැනීම කල් තැබීම හෝ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
RDB Regional Development Bank


ප්‍රධාන මානව සම්පත් නිලධාරී,
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැළණිය.
0112 03 54 54 | www.rdb.lk